(vi) Prepositions
(vii) Deteminers
(viii) Question words
(ix) Model Auxiliaries, Can Could, May, Might, Should, Must, Ought.
(x) The Definite Article
(xi) Cardinals/Ordinals
(xiii) The Passive Construction
(xiii) Relative Clauses
(xiv) If Clauses
(xv) Reported Speech
(xvi) There is/There are
(xvii) Have/Has

(b) Vocabulary tested will be that of General Modern English with special emphasis on the following field of Management Administration and Social and Economic Development

(c) Writing - Ability to write Essays, Department Reports, Official Letters

Oral Examination (15 minutes)

a. Speech
b. Listening Comprehension
c. Reading

(2) Scheme of Examination

(1) Written examination - There will be one paper of 3 hrs duration (75% Marks)

(2) Oral examination - 5 Minutes duration (25% Marks)

04. ඉල්ලුම් කිරීමේ ක්‍රමය ඃ

(අ) මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව ඉල්ලුම් පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ සකස් කර ගත යුතුය. ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක (1) සිට (3) තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය 2 වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු වන අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2014.11.03 දිනට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
(සංවිධාන හා විදේශ විභාග ශාඛාව)
තැ. පෙ. 1503,
කොළඹ.

(ඇ) ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ ඉහළ වමත් පස "ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන්ගේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන කිසිම ඉල්ලුම් පත්‍රයක් භාරගනු නොලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ඈ) ඉල්ලුම් පත්‍ර ලැබුණු බවට අයදුම්කරුවන්ට දන්වනු නොලැබේ. අයදුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම විභාග කොමසාරිස් ජනරාල් විසින් පුවත්පත් මඟින් ඒ බව නිවේදනය කරනු ලැබේ. එවැනි නිවේදනයක් පිළිබඳව විමසිල්ලෙන් සිටීම වැදගත් වේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එහිදී ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ඔබගේ එම විස්තර සමග ෆැක්ස් අංකයක්ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් ම විමසා සිටීම ද සුදුසු වේ. එසේ විමසීමේ දී අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීම සඳහා ඔබ ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා ඉල්ලුම් පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය ද සූදානම් කොට තබා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

05. විභාගයට පෙනී සිටීම ඃ

(අ) ඉල්ලුම්පත් එවා ඇති සියළුම අපේක්ෂකයින්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග ශාලාධිපතිට, අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාග අපේක්ෂකයින් අනුගමනය කළ යුතු රීති මාලාවක් ගැසට් නිවේදනයේ ඇතුළත් කර ඇත.

සටහන ඃ- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කර තිබීම විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(ආ) *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍රවලින් එකක් පමණක් පිළිගනු ඇත.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

බී. විජයරත්න,
ලේකම්,
යෞවන කටයුතු හා නිපුණතා
සංවර්ධන අමාත්‍යාංශය.

2014 ඔක්තෝබර් මස 03 වැනි දින,
කොළඹ 05, ඇල්විටිගල මාවතේ
අංක 354/2 "නිපුණතා පියස"
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014

**First Efficiency Bar Examination for Enterpreneurship Development Training Officers of the Small Enterprises Development Division of the Ministry of Youth Affairs and Skills Development - 2014**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ඃ- ☐

සිංහල - 2 / දෙමළ - 3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. නම :
 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
 (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
 උදාහරණය : GUNAWARDHANA, M. G. B. S. K

 1.2 සම්පූර්ණ නම :————.
 (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

 1.3 සම්පූර්ණ නම :————.
 (සිංහලෙන්)

 1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02.
 2.1 රාජකාරි ලිපිනය :————.
 (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
 (මෙම ලිපිනයට ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)

 2.2 ස්ථිර ලිපිනය :————.
 (සිංහලෙන්)

 2.3 ස්ත්‍රී/පුරුෂ භාවය :
 (ස්ත්‍රී - 1, පුරුෂ - 0)
 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

03. විභාගයට පෙනී සිටින විෂයයන් :

 1. ………… එම විෂය අංකය
 2. ………… එම විෂය අංකය
 3. ………… එම විෂය අංකය

04. විභාගයට පෙනී සිටින්නේ කීවන වතාවට ද යන වග :————.

05. විභාග ගාස්තු :

(i) ගෙවන ලදගාස්තුව : රු.:————. (ii) ගෙවූ කාර්යාලය :————.

(iii) ගෙවූ දිනය :————. (iv) ලදුපත් අංකය :————.

*ගැසට් නිවේදනයේ අංක 02 (ඊ) ඡේදය අනුව, විභාග ගාස්තු ගෙවූයේ නම් එම ලදුපත මෙහි අලවන්න. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත.*

ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

### *ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන …………………… මයා/මිය/මෙනවිය, මා ඉදිරියේදී අත්සන් තැබූ බවද, ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවද අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බව ද සහතික කරමි. තවද, ඔහු/ඇය පළමු වතාවට මෙම විභාගය සඳහා පෙනී සිටින බවද/විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
ලිපිනය :————.

10-230

---

### පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන ක්ෂේත්‍ර සහකාර තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන ක්ෂේත්‍ර සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *වැටුප් ක්‍රමය* :-

PL : 2-2006-A රා. ප. ච. ලේඛ 06/2006 (IV) අනුව
රු. 12,210-10x130-10x145-10x160-12x170-රු. 18,600.00

2. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

(iii) වන ක්ෂේත්‍ර සහකාරවරුන් වශයෙන් තෝරාගනු ලබන අපේක්ෂකයින් නියෝග කරනු ලබන දිවයිනෙ ඕනෑම ප්‍රදේශයක් ඕනෑම තත්වයක් යටතේ සේවය කිරීමට සුදානම්ව සිටිය යුතු ය.

විශේෂයෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන්ට, වනාන්තර ආරක්ෂා කිරීම, වන අපරාධ පිළිබඳව පරීක්ෂා කිරීම, වන අපරාධකරුවන් හා වනජ ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම හා උසාවියට ඉදිරිපත් කිරීම ආදී දුෂ්කර හා අවදානම් රාජකාරි සඳහා ඉහළ නිලධාරින්ට සහාය ලබාදීමට සිදුවේ. බොහෝවිට රජයේ නිවාඩු දිනවල හා රාත්‍රී කාලයේ දී පවා මෙවැනි කටයුතුවල පෞද්ගලිකවම යෙදීමට මෙම නිලධාරින්ට සිදුවේ.

ඉහත සඳහන් පරිදි වන ක්ෂේත්‍ර සහකාරවරුන්ගේ රාජකාරිවල දුෂ්කර සහ අවදානම් සහගත බව නිසා, කාන්තාවකට එම කටයුතුවල යෙදීම ප්‍රායෝගිකව අපහසු විය හැකි ය.

(iv) *ගැසට් පත්‍රයේ* (IIඅ) ඡේදය ආරම්භයේ පළ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීමේ දී අදාළ වන පොදු කොන්දේසි අදාළ වේ.

(v) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

3. *වයස් සීමාව.*—ඉල්ලුම් පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. ඒ අනුව 1996.10.31 දිනට හෝ ඊට පෙර හා 1969.10.31 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත. දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ අනුයුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවනු ඇත.

4. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.*—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06ක් සමත්ව තිබිය යුතුය.

(ii) වන සංරක්ෂක ජනරාල් විසින් තනතුරට අදාළ බවට තීරණය කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා දෙවන මට්ටමේ (N. V. Q. - 2) නිපුනතා සහතිකයක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(iii) පිරිමි අයදුම්කරුවන්ගේ උස අඩි 5යි අඟල් 02ට නොඅඩු හා පපුව අඟල් 32ට නොඅඩු විය යුතුය.

(iv) කාන්තා අයදුම්කරුවන්ගේ අවම උස අඩි 5ක් විය යුතුය.

(v) අයදුම්කරුවන් මනා චරිතයකින් යුක්ත විය යුතුය.

(vi) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක ඕනෑම තත්වයක් යටතේ සේවය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ඉහත 04 ඡේදය යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන්, ලිඛිත පරීක්ෂණයකින් ලබා ගන්නා සමත් ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක් කර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හා විභාගයේදී ලබා ගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, පවත්නා/නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපි ලෙස බඳවා ගනු ලැබේ. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් සියළු දෙනා වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results. gov.lk වෙබ් අඩවිය හරහා හෝ සිදු කෙරෙනු ඇත.

(ii) ඉහත 5.1 ඡේදයේ සඳහන් පරිදි, බඳවා ගැනීමට නියමිත/ පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේදී, සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කීප දෙනෙක් සිටිය හොත්, එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගනු ලැබේ.

(iii) ඉහත 5.1 යටතේ සුදුසුකම් මත තෝරාගනු ලබන අපේක්ෂකයින් වසර 03ක් ඇතුලත වෘක්ෂ විද්‍යා පරීක්ෂණයට (ප්‍රාරම්භක මට්ටම) පෙනී සිට සමත්වීමෙන් පසුව හා වසර 03ක සතුටුදායක සේවා කාලයකින් පසුව සේවයේ ස්ථිර කරනු ලැබේ.

(iv) තනතුරට බඳවා ගනු ලබන නිලධාරීන් වසර තුනක් ඇතුලත ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ වන ක්ෂේත්‍ර සහකාරවරුන් සඳහා පවත්වනු ලබන න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාව හදාරා අදාල විභාගය සමත්වී N. V. Q. 4 මට්ටමේ සහතිකයක් ලබා ගැනීමෙන් අනතුරුව ස්ථිර සේවා කටයුතුවල යොදවනු ලැබේ.

6. *විෂය නිර්දේශය :*

ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය.

(i) *බුද්ධි පරීක්ෂණය* - කාලය පැය 01 - ලකුණු සංඛ්‍යාව 100 අපේක්ෂකයාගේ සිතීමේ තර්කාණුකූලතාවයත්, විශ්ලේෂණ තත්ත්වයත්, තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(ii) *තාක්ෂණ ප්‍රශ්න පත්‍රය* - කාලය පැය 02. ලකුණු සංඛ්‍යාව 100

මෙම ප්‍රශ්න පත්‍රය, වන සම්පත සහ එය ජීවීන්ගේ පැවැත්ම සඳහා බලපානු ලබන ආකාරයන් පිළිබඳ අවබෝධය, ශ්‍රී ලංකාවේ පාරිසරික දැනුවත්බව - භූගෝලීය වැදගත්කම පිළිබඳ අවබෝධය, ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ආර්ථිකය පිළිබඳ වූ දැනුම, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ වැදගත් තොරතුරු - එහි කාර්යයන් හා පරමාර්ථ පිළිබඳ අවබෝධය, ස්වාභාවික පරිසරය, වනාන්තර හා වෘක්ෂලතා පිළිබඳ දැනුම, වනාන්තර හා මහජනතාව අතර ඇති සමීප සම්බන්ධතාවය පිළිබද වැදගත්කමේ අවබෝධය, භූගෝලිය විද්‍යාව පිළිබඳ මූලික දැනුම (ඍතුවීවියේ හැඩය, භූ ලක්ෂණ ආදිය) හා අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම පිළිබඳව මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(iii) අපේක්ෂකයින් මෙම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. සාමාර්ථ්‍යය සඳහා එක් එක් පත්‍රයට අවම වශයෙන් ලකුණු 40% ක් වත් ලබාගත යුතුවේ.

7. *අයදුම්පත් හා අනෙකුත් විස්තර :*

(i) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, අයදුම් පත්‍රයේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද, ඉතිරිය ඊළඟ පිටුවලටද ඇතුලත් වන පරිදි, සෙ. මී. 21 x 29 (ඒ 4 ප්‍රමාණයේ) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත සකස් කල යුතු අතර, අයදුම්පත්‍රය විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කල යුතුය. ඉල්ලුම් පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, "වන ක්ෂේත්‍ර සහකාර තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2014" යනුවෙන් සඳහන් කර 2014.10.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට හෝ නොඑවිය යුතුය.)

(ii) අසම්පූර්ණ හෝ ප්‍රමාදවී හෝ ලැබෙන ඉල්ලුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) තැපෑලේ දී අස්ථාන ගතවන ඉල්ලුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

(iv) ඉල්ලුම් පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු හෝ සාමදාන විනිශ්චකාරයකු හෝ යුධ, නාවික, ගුවන් හමුදා අධිකාරි බලයලත් නිලධාරියකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරනු

ලබන මාණ්ඩලික නිලධාරියකු හෝ තමා පදිංචි වසමේ ග්‍රාම නිලධාරිවරයා විසින් සහතික කරනු ලැබිය යුතුය.

(v) මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) රජයේ සේවයේ අනුයුක්ත නිලධාරින් තම ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කල යුතු අතර, සුදුස්සකු වශයෙන් තේරී පත් වුවහොත් එම දෙපාර්තමේන්තුවේ සේවයෙන් නිදහස් කිරීමට එකඟ වන බවට සඳහන් කල යුතුය.

(vii) ඉල්ලුම් පත ලද බව දන්වනු නොලැබේ.

8. *විභාග ගාස්තු* :

(i) විභාග ගාස්තුව රු. 400 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි, දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයකට ඉහත මුදල ගෙවා, ලබාගත් මුදල් බාර ගැනීමේ කුවිතාන්සිය/ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම සුදුසුය.)

(ii) කුමන කරුණක් යටතේ වුවද විභාග ගාස්තුව ආපසු නොගෙවන අතර, වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩ දෙනු නොලැබේ.

09. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කල යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකයක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත)
(iv) චරිත සහතික දෙකක්
(v) වෙනත් අදාළ සහතික

***සැලකිය යුතුයි*** : ලියකියවිලි/සහතික හෝ ඒවායේ පිටපත් ඉල්ලුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය.

10. විභාග මධ්‍යස්ථාන හා ප්‍රවේශ පත්‍ර :

(i) විභාගය මෙහි උපලේඛනය - 1 හි දැක්වෙන නගරවල පිහිවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර හා ඊට අදාළ අංක අයදුම්පත්‍රයේ ශීර්ෂයේ පළමු හා දෙවැනි තේරීම වශයෙන් සඳහන් කළ යුතුය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

(ii) නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතුය.

(iv) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* - විභාග පරීක්ෂක සෑහීමකට පත්වන අයුරින් ඉල්ලුම්කරු තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු අතර, ඒ සඳහ පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්.*—තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම අවලංගු කළ හැකි අතර, අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වෙනස් කර ඇති බව හෝ ඔහු තෝරා ගැනීමට පසුව හෙළිවුවහොත් ඔහු රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත් වනු ඇත.

13. අවශ්‍ය අවස්ථාවකදී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වන සංරක්ෂ ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

වන සංරක්ෂක ජනරාල්.

2014 සැප්තැම්බර් මස 16 වැනි දින,
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන ක්ෂේත්‍ර සහකාර තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2014***

(Open Compititive Examination for Recruitment to the Post of Forest field Assistant of the Department of Forest - 2014

විභාගයට පෙනී සිටින නගරය :

| | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(උපලේඛනය - 1 අනුව සම්පූර්ණ කරන්න.)

01. විභාගයට පෙනී සිටින මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාල අංකය කොටුව තුල ලියන්න)

02. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, M. G. B. S. K.)
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. (i) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. ස්ත්‍රී/පුරුෂභාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාල අංකය කොටුව තුල ලියන්න.)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. (i) උපන් දිනය : අවුරුද්ද මාසය දිනය

(ii) 2014.10.31 දිනට වයස : අවුරුදු මාස දින

07 පුරවැසිභාවය :

පරම්පරාවෙන් - 1

ලියාපදිංචි වීමෙන් - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

08. දුරකථන අංකය :

09. ශාරීරික යෝග්‍යතාවය : 1. උස :————. 2. පපුව අඟල් :————. (කාන්තා අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

10. අධ්‍යාපන සුදුසුකම් :

1. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

1 වන වර
වර්ෂය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

2 වන වර
වර්ෂය :————.
විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

11. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

12. වෘත්තීය/වෙනත් සුදුසුකම් :————.

13. (i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.

(ii) ලදුපතේ අංකය හා දිනය :————.

කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න

14. (i) ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද? ඔව්/නැත

(ii) ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

15. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම්, ඒ පිළිබඳව විස්තර.

(i) ආයතනය :————. (iii) තනතුර :————.
(ii) මුල් පත්වීම් දිනය :————. (iv) වැටුප :————.

16. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න.
(i) ————.
(ii) ————.

17. අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය බවට ද, නිවැරදි බවටද මම සහතික කරමි. මෙහි ඇතුළත් වූ තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මගේ අයදුම්පත අවලංගුවීමට යටත් බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

18. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ...................... මහතා/මහත්මිය/මෙනවිය/මා පෞද්ගලිකව දන්නා බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී 2014 ........... වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

19. අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය.

මෙම අයදුම් පත ඉදිරිපත් කරන......................... .............. මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ .............. ලෙස ස්ථිර/තාවකාලික තනතුරක් දරන බවත්, ඔහු/ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරින් මුදා හැරිය හැකි/නොහැකි බවද මෙයින් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින්
බලය පැවරූ නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
(මුද්‍රාව තබන්න)
දිනය :————.

(අනවශ්‍ය වචන කපා හරින්න.) සැ. යු. ඃඉල්ලුම්පත්‍රය සමග මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය/ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

**උපලේඛනය - 1**

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

10-214

---

**සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය**

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

**මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර/රසායනාගාර සහකාර තනතුර සඳහා පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2014**

Limited Competitive Examination for the Recruitment to the Posts of Inspectors of Measurement Services Devices/Lab Assistant of the Sri Lanka Technical Service in the Department of Measurement Units, Standards and Services - 2014

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තු වෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III පන්තියේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුරු හා රසායනාගාර සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කොළඹ දී පමණක් පැවැත්වෙන අතර, මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කල ඉල්ලුම් පත්‍ර 2014.10.31 වැනි දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වමත්පස

ඉහළ කෙලවරේ "මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර/රසායනාගාර සහකාර තනතුර සඳහා සීමිත තරග විභාගය 2014" යන්න සඳහන් කළ යුතු ය.

01. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
(ii) පත්වීම අවුරුදු දෙකක පුහුණු සීමාවකට යටත් වේ.
(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාලය තුළදී ලබා ගත යුතු ය.
(iv) තනතුරෙහි III වන පන්තියට බඳවා ගෙන වසර 03ක් ගත වීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම ද, II වන පන්තියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම ද, I පන්තියට පත්වී වසර 05ක් ගතවීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉමද සමත් විය යුතුය.

(2) වැටුප් හා දීමනා :

අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස සුදුසුකම් ලැබූ නිලධාරින් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් ද්‍රැරූ වැටුප් ප්‍රමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ දෙපර්තමේන්තුව විසින් පවත්වනු ලබන නිපුණතා පරීක්ෂණය සමත්වන තුරු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු ශ්‍රේණියේ සතුටුදායක ලෙස ගත කරන නිලධාරියෙකුට දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේ ඊළඟ වර්ධකය ලබා දෙන අතර දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ. විභාගය සතුටුදායක ලෙස සම්පූර්ණ කල විට 2000.03.02 දිනැති අංක 7/2000 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැටුප් පරිවර්තනය කෙරේ.

තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය :
මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක/රසායනාගාර සහකාර

MN3 - 2006A
රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 -රු. 27,885

03. අධ්‍යාපනික සුදුසුකම් :

(i) මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක :

භාෂාව, ගණිතය, විද්‍යාව යන විෂයනට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො. ස. (සා. පෙළ) විභාගය විෂයන් 06කින් සමත්වීම.

වෘත්තීය සුදුසුකම් - අදාල නොවේ.

04. පළපුරුද්ද :

(i) මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර

කිරුම් මිනුම් යාන්ත්‍රික ශිල්පියකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද හෝ මිනුම් ප්‍රමිති සේවා සහයකයකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද.

(ii) රසායනාගාර සහකාර තනතුර :

කිරුම් මිනුම් යාන්ත්‍රික ශිල්පියකු වශයෙන් වසර 10ක පළපුරුද්ද හෝ මිනුම් ප්‍රමිති සේවා සහයකයකු වශයෙන් වසර 10ක පළපුරුද්ද හෝ රසායනාගාර සහයකයකු වශයෙන් වසර 10 ක පලපුරුද්ද.

05. වෙනත් සුදුසුකම් :

(i) නියමිත දිනට පූර්වාසන්න වසර 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය ;

(ii) තනතුර ස්ථිර කර තිබීම;

(iii) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් හෙබි අයකු විය යුතු ය.

(iv) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර තිබිය යුතුය.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සීමිත තරග විභාගයකින් සමත් විය යුතු ය.

පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන අයදුම්කරුවන් දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව අවසානයේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන නිපුණතා පරීක්ෂණය සමත්විය යුතුය. නිපුණතා පරීක්ෂණය සමත් වන නිලධාරින් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III වන පන්තියට බඳවාගනු ලැබේ.

*මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර ලිඛිත විභාගය*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැ. 01 |
| තාක්ෂණය හා විෂයානුබද්ධ පරීක්ෂණය | 100 | 40% | පැ. 01 |

*රසායනාගාර සහකාර තනතුර ලිඛිත විභාගය*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැ. 01 |
| තාක්ෂණය හා විෂයානුබද්ධ පරීක්ෂණය | 100 | 40% | පැ. 01 |

එක් එක් විෂයකින් සමත් වීම සඳහා 40% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් ලකුණු ලබාගත යුතුය. මුළු ලකුණුවල කුසලතාවේ අනුපිළිවෙලට අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා ප්‍රමාණය මෙන් අපේක්ෂකයන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණට කැඳවා සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තාවූත්, විෂයයන් දෙකින්ම උපරිම මුළු ලකුණු ලබාගත්තාවූත් අපේක්ෂකයන් පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් කෙරේ. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල දන්වා යැවීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලැබේ.

07. ලිඛිත විභාගය :

* විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය වලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට ඉල්ලුම් කළ මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය.

* විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. බුද්ධි පරීක්ෂණය තනතුරු දෙකම සඳහා පොදු වන අතර අපේක්ෂකයන් විසින් එක් එක් තනතුරට අදාළව තාක්ෂණික ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතුය.

(01) මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක :

(i) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි.

* අපේක්ෂකයාගේ තර්කානුකූලතාව, සිතීමේ හැකියාව, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ii) තාක්ෂණය හා විෂයානුබද්ධ පරීක්ෂණය - කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි.

* පඩි, මිමි සහ කිරුම් මිනුම් උපකරණ පිළිබඳ මූලික දැනුම, [ (අ) මූලධර්ම, (ආ) ක්‍රියාකාරිත්වය, (ඇ) ප්‍රායෝගික භාවිතය, (ඈ) ඒ හා සම්බන්ධ දෙපාර්තමේන්තු රෙගුලාසි.]

* මිනුම් ඒකක පිළිබඳ මූලික දැනුම, [(අ) ජාත්‍යන්තර සම්මත ඒකක (SI Units), (ආ) ව්‍යුත්පන්න ඒකක, (ඇ) විවිධ රාශීන් මැනීම සඳහා භාවිතා කරනු ලබන ඒකක.]

(02) රසායනාගාර සහකාර තනතුර :

(i) බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි.

* අපේක්ෂකයාගේ තර්කානුකූලතාව, සිතීමේ හැකියාව, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ii) තාක්ෂණය හා විෂයානුබද්ධ පරීක්ෂණය - කාලය පැය 01 කි. මුළු ලකුණු 100 යි.

* ජාතික මිනුම් පර්යේෂණාගාරයේ භාවිත වන උපකරණ පිළිබඳ දැනුම, [(අ) මූලධර්ම, (ආ) ක්‍රියාකාරිත්වය, (ඇ) ප්‍රායෝගික භාවිතය, (ඈ)එම උපකරණ භාවිතා කරන ක්‍රමවේදය හා නඩත්තුව.]

* මිනුම් ඒකක පිළිබඳ මූලික දැනුම, [(අ) ජාත්‍යන්තර සම්මත ඒකක (SI Units), (ආ) ව්‍යුත්පන්න ඒකක, (ඇ) විවිධ රාශීන් මැනීම සඳහා භාවිතා කරනු ලබන ඒකක.]

* පර්යේෂණාගාරයේ පවත්වාගෙන යා යුතු පාරිසරික තත්ව පිළිබඳ දැනුම [(අ) උෂ්ණත්වය, (ආ) සාපේක්ෂ ආර්ද්‍රතාවය, (ඇ) වාතයේ ගුණාත්මක භාවය.)]

08. අයදුම් පත්‍ර හා අයදුම් කරන ආකාරය :

ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 09 දක්වා පළමුවන පිටුවට ද 10 සිට 12 දක්වා දෙවන පිටුවට ද ඉතිරිය තෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ඉල්ලුම්කරුට ප්‍රයෝජනවත් විය හැක. තව ද ඉල්ලුම් පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වන අතර ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

09. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සියද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම්, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකයක් ද සමග ඉහත ඔබගේ විස්තර ඇතුලත් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

10. එක් තනතුරක් සඳහා පමණක් අයදුම් කරන්නේ නම් විභාග ගාස්තුව රු. 1000 ක් වන අතර, තනතුරු දෙකම සඳහා අයදුම් කරන්නේ නම් විභාග ගාස්තුව රු. 1,300 කි. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා ලබාගන්නා ලද ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයක් ඇලවිය යුතුය. කුමන කරුණක් නිසාවත් විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවනු නොලැබේ. අයදුම්පතේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපත් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

11. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාග වලදී අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

12. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවන අතර මෙම නිවේදනය තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට හා අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ හි ඇතුළත් විධිවිධාන වලට යටත් වේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

අධ්‍යක්ෂක,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව.

2014 සැප්තැම්බර් මස 10 වැනි දින,
අංක 101,
උද්‍යාන පාර,
කොළඹ 05.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර/ රසායනාගාර සහකාර තනතුර සඳහා පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2014**

Limited Competitive Examination for the Recruitment to the Posts of Inspectors of Measurement Services Devices / Lab assistant of the Sri Lanka technical Service of Department of Measurement Units, Standards and Services - 2014

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරනු ලබන තනතුර :

මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර සඳහා අංක 01 ද, රසායනාගාර සහකාර තනතුර සඳහා අංක 02 ද, තනතුරු දෙකම සඳහා අංක 03 ද යොදන්න.

1. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් : උදාහරණ : GUNAWARDHANA M. G. B. S. K.

2. සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

3. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

4. ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.

5. ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ - 0, ස්ත්‍රී -1) අදාළ අංකය කොටුව තුළ ලියන්න.

6. විවාහක/අවිවාහක බව : (විවාහක -1, අවිවාහක - 2) : අදාළ අංකය කොටුව තුළ ලියන්න.

7. ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)

අදාළ අංකය කොටුව තුළ ලියන්න.

8. ජාතික හැඳුනුම්පත් අංකය :

9. (අ) උපන් දිනය :

වර්ෂය මාසය දිනය

(ආ) ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න. (ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :————.

11. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් :-

11.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය :

| | විභාගය සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |
| 7 | | | | |
| 8 | | | | |
| 9 | | | | |
| 10 | | | | |
| 11 | | | | |
| 12 | | | | |

11.2 වෙනත් අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් :

| විභාගය | ආයතනය | දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

12. වර්තමාන රැකියාව සහ ඉහතදී යම් පත්වීමක් දැරුවේ නම්,

| තනතුර | සිට | දක්වා | වාර්ෂික වැටුප |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13. ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ පවත්වා/පවත්වමින් තිබේ ද? :————.

14. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියකින් වරදකරු වී තිබේ ද? :————.

15. අදාළ වෙනත් තොරතුරු :————.

16. විභාග ගාස්තුව ගෙවූ :- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

දිනය :————.

ලදුපත් අංක :————.

විභාග ගාස්තුව ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.

17. අයදුම්කරුගේ සහතිකය ෘ

මෙහි සඳහන්කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද ............ වැනි දින හා අංක ............ දරන ලදුපත මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුවද මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටද යටත් වන බවත් එසේම විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

18. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව ෘ

ඉහත දී ඇති විස්තර නිවැරදි බවත්/පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම ............ බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදා හැරිය හැකිය/නොහැකිය.

(අදාළ නොවන වචන කපා හරින්න.)

————,
දෙපාර්තමේන්තු/ආයතන
ප්‍රධානියාගේ අත්සන.

තනතුර :————.

(නිල මුද්‍රාව මගින් සනාථ කළ යුතු ය)

දිනය :————.

10-30

---

## රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2013 (2014)

අංක 1878 දරන 2014 අගෝස්තු මස 29 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද "රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2013 (2014)" නිවේදනයේ 8.0 යෝග්‍යතාවය ඡේදයෙහි (iii) කොටස, 9.0 අයදුම්පත් ඡේදයෙහි (ඇ) උප වගන්තිය, 10.0 ඡේදයෙහි අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කළ යුතු දිනය සහ අංක 1879 දරන 2014 සැප්තැම්බර් මස 05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද "රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2013 (2014)" නිවැරදි කිරීමේ නිවේදනයෙහි 8.0 යෝග්‍යතාවය ඡේදයෙහි (vi) කොටස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

8.0 යෝග්‍යතාවය ෘ-

(iii) අපේක්ෂකයන් භාෂාව/සාහිත්‍ය හා අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව විෂයයන් හයක් (06) ඇතිව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගයෙන් සමත්ව සිටිය යුතු ය.

(vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් 2014 ඔක්තෝබර් මස 10 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

9.0 අයදුම්පත් ෘ-

(ඇ) අයදුම්පත නිවැරදිව ද පැහැදිලිව ද අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත් අකුරින්ම සම්පූර්ණ කොට 2014.10.10 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ,

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503,
කොළඹ.

යන ලිපිනයට, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මාර්ගයෙන් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය.

10.0 2014.10.10 වැනි දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම සඳහා ස්වකීය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කල් ඇතුව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්/ අයදුම්කාරියන් වෙත දන්වා සිටිනු ලැබේ.

* මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2014 ඔක්තෝබර් මස 10 ලෙස දීර්ඝ කරනු ලැබේ.

* නිවේදනයේ ආදර්ශ අයදුම්පත්‍රයෙහි 4.12 කොටසේ සඳහන් දිනය ද දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයෙහි 3, 5, 7, කොටස්වල සඳහන් දිනයන් ද 2014.10.10 ලෙස සංශෝධනය වේ.

* මේ වන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන්හට නැවත අයදුම්කිරීමෙන් වලකින ලෙස දන්වනු ලැබේ.

* එම ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්‍ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2014 සැප්තැම්බර් මස 18 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

10-284

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) තනතුරට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2014**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) තනතුරුවල පවතින පුරප්පාඩු 05ක් පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙළවරේ "ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්) III පන්තිය තනතුරට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2014" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2014.10.31 දින වේ.

*සටහන.*—ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

2. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත විභාගයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කළ ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% හෝ ඊට වඩා ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් (5) ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු දීමේ පටිපාටියට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබේ.

ලිඛිත විභාගයේ ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත සුදුසුකම්ලත් අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

3. සේවයේ නියුක්තකරවීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය ;

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත්වේ ;

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන හා ඊට අනුෂාංගික වන චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම පත්වීම භාරගත් දින සිට වර්ෂ පහක් ඉකුත් වීමට පෙර, රජයේ ප්‍රතිපත්තිවලට අනුරූපව රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගත් බව ඔබ විසින් සනාථ කළ යුතුවේ ;

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ ;

4. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL — 2006 රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1050 - රු. 53,555-ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

5. සුදුසුකම් :

5.1 *අධ්‍යාපන සුදුසුකම් :*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම ;

හෝ

සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, යන විෂයයන් සහිතව අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක්වර විෂයයන් 04කින් සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය අනුව) ;

හෝ

ජීව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව අ.පො.ස (උ.පෙළ) නව නිර්දේශ විභාගයෙන් එක්වර විෂයයන් 03කින් සමත්ව සිටීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) ;

හෝ

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ පැරණි විෂය නිර්දේශය/නව විෂය නිර්දේශය යටතේ විෂයයන් 2කට සම්මාන සහිතව විෂයයන් 03ක් සමත්වීම.

5.2 *වෘත්තීය සුදුසුකම්.*—විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

5.3 *පළපුරුද්ද :*

(අ) උපාධියක් සහිත අයදුම්කරුවන් සඳහා

(i) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සිටින වැඩ සටහන් කළමණාකරු, තත්ත්ව පාලන නිලධාරි, ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර පරීක්ෂක හා ධීවර බලපත්‍ර නිලධාරී යන තනතුරුවල ස්ථිර කරනු ලැබ ඇති එම තනතුරුවල අවුරුදු 05ට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධාරියෙකු වීම ;

(ii) නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වී තිබීම ;

(iii) පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

(*ආ*) *උපාධියක් රහිත අයදුම්කරුවන් සඳහා*

(i) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සිටින ධීවර පරීක්ෂක , ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර බලපත්‍ර නිලධාරි යන තනතුරුවල ස්ථිර කරනු ලැබ ඇති නිලධාරියෙකු වීම සහ අවුරුදු 10ට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති නිලධාරියෙකු වීම" ;

(ii) නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වී තිබීම ;

(iii) පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

5.4 *කායික සුදුසුකම්* :,

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ;

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5.5 *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය ;

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය ;

(iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතුය.

6. වයස් සීමාව : අදාළ නොවේ.

7. විෂය නිර්දේශය :

7.1 *ලිඛිත විභාගය* :

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විධායක නිලධර ගණයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර 03කින් සමන්විත වේ.

| *විෂයයන්* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම හා බුද්ධ පරීක්ෂණය | පැය 1 1/2 | 100 | 40% |
| 2. ධීවර පනත හා රෙගුලාසි | පැය 1 1/2 | 100 | 40% |
| 3. ආයතන සංග්‍රහය/රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති හා මුදල් රෙගුලාසි | පැය 1 1/2 | 100 | 40% |

7.2 *ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය* :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටලු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| ධීවර පනත හා රෙගුලාසි | (i) (*අ*) ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන සම්බන්ධ මූලික දැනුම<br>(*ආ*) ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම පිළිබඳ මූලික දැනුම<br>(*ඇ*) මසුන් සහ වෙනත් ජලජ සම්පත් ආරක්ෂා කිරීම පිළිබඳ විධිවිධාන සම්බන්ධ මූලික දැනුම<br>(ii) වරින් වර පනවා ඇති ධීවර නියෝග සම්බන්ධ මූලික දැනුම<br>(iii) ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සම්බන්ධ මූලික දැනුම යන කරුණු මැන බැලීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| ආයතන සංග්‍රහය/ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පරිපාටික රීති හා මුදල් රෙගුලාසි | රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.<br><br>ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද ආවරණය කරමින් කාර්යාල කළමණාකරණයේ දී වැදගත් වන ආයතන කටයුතු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකිවන පරිදි ආයතන සංග්‍රහයේ I කාණ්ඩය ඇසුරින් සකස් කරනු ලැබේ.<br><br>I වන පරිච්ඡේදය - සාමාන්‍ය<br><br>II වන පරිච්ඡේදය - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි හා පත් කිරීම<br><br>IV වන පරිච්ඡේදය - මාස් පඩි, තාවකාලික තත්ත්වය, ස්ථිර තත්ත්වය, සහ විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම<br><br>V වන පරිච්ඡේදය - මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම හා සේවය අවසන් කිරීම<br><br>VII වන පරිච්ඡේදය - වැටුප්<br><br>IX වන පරිච්ඡේදය - ගාස්තු |

XXVII ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග

XXXI සමිති සමාගම් පවත්වාගෙන යාමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් භුක්ති විඳීම

XXXII දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම

XLVII සාමාන්‍ය හැසිරීම හා විනය

XLVIII විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය

III වන පරිච්ඡේදය : පත් කිරීම

IV වන පරිච්ඡේදය : සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි

VI වන පරිච්ඡේදය : පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි

VIII වන පරිච්ඡේදය : පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම

XII වන පරිච්ඡේදය : රජයේ නිලධාරියෙකු රජයේ සේවයෙන් තාවකාලිකව හෝ ස්ථිරව මුදා හැරීම

XVI වන පරිච්ඡේදය : සේවය දීර්ඝ කිරීම හා විශ්‍රාම ගැන්වීම

රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ. මේ සඳහා මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද අදාළ වේ.

මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වන බාණ්ඩයේ I සිට IX දක්වා

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

7.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත විභාගයේ එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් 40% හෝ ඊට වඩා ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් (05) ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දීම කරනු ලැබේ.

සටහන.— ව්‍යුහගත පරීක්ෂණය සඳහා කැඳවීම පත්වීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකණු නොලැබේ.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| වෘත්තීය සුදුසුකම් | 10 |
| පළපුරුද්ද | 25 |
| පරිගණක හැකියාව | 15 |
| භාෂා ප්‍රවීණතාව | 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 |
| එකතුව | 100 |

7.4 විභාග ප්‍රතිඵල :

සම්මුඛ පරීක්ෂණ ලකුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් විභාග කොමසාරිස් ජනරාල් වෙත ලබාදුන් පසුව විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගයේ ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ ලකුණු එකතුවෙහි ප්‍රමුඛතාව සැලකිල්ලට ගනිමින් කුසලතා අනුපිළිවෙලට සකස් කරන ලද අවසන් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබාදෙනු ඇත. අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් මගින් සිදුකෙරේ.

8. විභාග කොන්දේසි :

(i) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර තුනටම (3ටම) පෙනී සිටිය යුතුය ;

(ii) විභාග ගාස්තුව රු. 1,000/-ක් වන අතර මෙම ගාස්තුව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැර වන ලෙස ඕනෑම තැපැල් කාර්යාලයක් හෝ උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලද කුවිතාන්සිය එහි එක් දාරයකින් ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ;

(iii) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ ;

(iv) මෙම විභාගය කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ ;

